සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පස්වැනි කලාපය, ද්විතීය භාගය, 2010 ජනවාරි , 349-362
ISSN 1800-1459

# සංවර්ධන පරිපාලනය පිළිබඳ හැඳින්වීමක්

**ජී. සී. එල්. පතිරණ**

*සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. 02, බෙලිහුල්ඔය.*

**සාරාංශය**

සංවර්ධනය පිළිබඳ ව විවිධ මතවාද ඉදිරිපත් වීම බහුල ව දැකිය හැකි ය. නිදහසින් පසුව සංවර්ධනය වෙමින් පවතින බොහෝ රාජ්‍යයන්හි ප්‍රධානතම අපේක්ෂාව බවට පත්වූයේ ද සංවර්ධනය යි. සංවර්ධනය වඩාත් සංකීර්ණ ප්‍රවේශයකින් ඉදිරියට පැමිනෙන්නේ නව රාජ්‍යයන් යයි අප විසින් හඳුනාගනු ලැබූ සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් සිය ආර්ථික වෘද්ධිය අපේක්ෂාවෙන් ක්‍රියාත්මක කරනු ලැබූ විවිධ සංවර්ධන වැඩසටහන් හා එහි කළමනාකාරිත්වයෙහි විවිධත්වයත් මුල් කරගෙන ය. සංවර්ධන පරිපාලනය ඉදිරියට පැමිනෙන්නේ සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳ ව ජාත්‍යන්තර පරිසරය විසින් මතු කරනු ලැබූ විද්‍යාත්මක ගවේෂණයක ප්‍රතිඵලයක් වශයෙනි. සංවර්ධන පරිපාලනය මගින් සිදුකරනු ලබන්නේ විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්හි සංවර්ධන සැලසුම් හා ප්‍රතිපත්තීන්ට විද්‍යාත්මක කළමනාකරණවාදී හුරුවක් ඇතිකරවීම ය. දේශපාලන විද්‍යාවේ උපවිෂයක් වන රාජ්‍ය පරිපාලනය හා ප්‍රතිපත්ති විද්‍යාවේ ප්‍රබල අධ්‍යයන හා පර්යේෂණ ක්ෂේත්‍රයක් ලෙස ද සංවර්ධන පරිපාලනය හඳුන්වාදිය හැකි ය.

සාම්ප්‍රදායික සංවර්ධන ප්‍රවේශය තුළ දී සලකා බලනු ලැබූයේ අපේක්ෂිත ආර්ථික ඉලක්ක ළඟාකර ගැනීම සඳහා විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව ය. එහි දි සංවර්ධන ප්‍රතිපත්ති ළඟාකර ගැනීමේ ජාතික ආර්ථිකය සතු හැකියාවත්, ඒ සඳහා පරිපාලන ක්‍රමයේ ශක්‍යතාව ආදිය පිළිබඳ ව පුළුල් සලකා බැලීමක් සිදුනොවී ය. සංවර්ධන පරිපාලනය විෂයක් ලෙස ඉදිරියට පැමිනෙන්නේ මෙම පරිසරය මත ය. එනිසා සංවර්ධන පරිපාලනය මගින් පැවැති සංවර්ධන අභියෝග ළඟාකර ගැනීමේ දී රාජ්‍ය තුළ පැවතිය යුතු පරිපාලන ස්ථාවරත්වය මෙන් ම දේශපාලන ක්‍රමයේ ධාරිතාව ද සලකා බලනු ලැබී ය.

මෙම ලිපියේ අරමුණ වන්නේ සංවර්ධන පරිපාලනය පිළිබඳ ව ඉදිරිපත් වී ඇති විවිධ ප්‍රවේශ හා අදහස් විමසා බැලීමත් ඒ හරහා සංවර්ධන පරිපාලනය මුල් කරගනිමින් වර්තමානයේ ඉදිරියට පැමිණ ඇති අභියෝග පිළිබඳ ව විචාරාත්මක විග්‍රහයක් සිදුකිරීමට ය.

**කේන්ද්‍රීය වචන** : සංවර්ධනය, සංවර්ධන පරිපාලනය, නිලබල ක්‍රමය, රාජ්‍ය ප්‍රතිපත්ති, කළමනාකරණවාදය

## හැඳින්වීම

සංවර්ධනය 1950 දශකයෙන් පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇතුළු ලෝකයේ බොහෝ රාජ්‍යයන්වල ප්‍රධාන අවධානය දිනාගත් මාතෘකාවකි. එක් ඇමරිකානු දාර්ශනිකයෙකුට අනුව සමස්ත ලෝකයා විසින් ම වැලඳගනු ලැබූ සංකල්පය වන්නේ සංවර්ධනය යි. සියලු ම ජාතීන්ට ඉන් මිදිය නොහැකි ය (Todaro and Smith, 2003: 43).

සංවර්ධනය පිළිබඳ පුළුල් සාකච්ඡාවකට අවශ්‍ය පසුබිම නිර්මාණය වන්නේ නව රාජ්‍යයන්ගේ ප්‍රභවයත් සමඟ ය. නව රාජ්‍යයන් ආශ්‍රිත ව පැනනැගුණු ජාතිය ගොඩ නැගීමත් සමාජ ආර්ථික සංවර්ධනයත් යන ප්‍රධාන ගැටළු දෙක වෙත අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව මත සංවර්ධනය පිළිබඳ සංකල්පය ජාත්‍යන්තර සමාජය හමුවේ පැන නැගෙන්නට පටන් ගනු ලැබී ය. ජාතික සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම වෙනුවෙන් තම ප්‍රතිපත්ති මෙහෙයවීම අලුතින් නිදහස ලැබූ රාජ්‍යයන්හි ප්‍රධාන ලක්ෂණයක් බවට පත් විය.

වර්තමාන ලෝක ප්‍රජාවට සුවිශාල අභියෝගයන් මධ්‍යයේ එම අරමුණු ළඟාකර ගැනීමට සිදුවී තිබේ. මේ නිසා සංවර්ධනය ඉතා පුළුල් හා ගැටළු සහගත සංකීර්ණ සංකල්පයක් බවට බොහෝ සමාජ හා දේශපාලන බුද්ධිමතුන්ගේ පිළිගැනීම බවට පත් වී තිබේ. සංවර්ධනය පිළිබඳ සංකල්පය හඳුනාගැනීමට දේශපාලන හා සමාජ විද්වතුන් ගනු ලැබූ උත්සාහයේ ප්‍රතිඵලයක් වූයේ ඒ පිළිබඳ ව පොදු නිර්වචනයක් ගොඩනගා ගැනීම කෙසේ වෙතත් සංකල්පිමය පදනම ප්‍රසාරණය වීම ය. බ්‍රැන්ඩ් (Brandt) කොමිසන් වාර්තාව පෙන්වා දෙන ආකාරයට සංවර්ධනය කිසිම දිනක කිසිම ආකාරයකින් ලෝකයා සතුටට පත්කළ නොහැකි සංකල්පයක් වේ. අප්හෝප් හා ඉල්ච්මන්(Uphoff and Ilchman) විසින් සඳහන් කර ඇති ආකාරයට සමාජ විද්‍යා සාහිත්‍ය තුළ ඉතාමත් ම අපැහැදිලි හා අවබෝධ කොට ගත නොහැකි වචනය සංවර්ධනය වේ. (Sapru,1976: 17-19) ඊට ප්‍රධාන හේතුව සංවර්ධනය ජාතීන් අනුව රාජ්‍ය අනුව හා ඒ  සඳහා ප්‍රවේශ වන මාර්ග අනුව වෙනස් වන බැවිනි. බොහෝ අවස්ථාවල සංවර්ධනය ජාතික ආර්ථිකයේ සිදුවන සංවර්ධනය මත සමපාත කොට ඇති සමාජ සංවර්ධනය හා සම්බන්ධ කිරීමට ද ගනු ලැබූ උත්සාහයක් බවට පත්විය. සමාජ ආර්ථික සංවර්ධනය පමණක් නොව දේශපාලන ක්‍රමයේ ධාරිතාව හඳුනා ගැනීම සඳහා සංවර්ධන සංකල්පය භාවිත වී තිබේ (Corbridge, 2000: 12). මේ නිසා සංවර්ධනයේ තේමාවන් හා එහි අන්තර්ගතය වඩාත් සංකීර්ණ ක්‍රියාවලියක් බවට පත් වී ඇත. බටහිර ලෝකයා විසින් ඉතිහාසය තුළ සංවර්ධනය හඳුනාගනු ලැබුවේ වෙනසින් මත සිදුවන වෘද්ධිය වශයෙනි (Coetzee and Wood , 2001: 18). නමුත් සංවර්ධනය වූ කලි තාර්කික ක්‍රියාවලියක් බවට එස්මාන් (Esman) ඉදිරිපත් කළ නිර්වචනය වඩාත් ප්‍රායෝගික වන බව පෙනී යයි (Cowen and Shenton, 1996: 4) ඊට හේතුව රාජ්‍යයන් තුළ සමාජ විවිධත්වය අනුව සංවර්ධනය විවිධ ස්වරූප ගන්නා බැවිනි.

කෝල්ම් හා ගෙ(යි)ගර් (Colm and Geiger) විසින් සංවර්ධනය වෘද්ධියත් සමඟ ම සිදුවන වෙනස්වීම ලෙසින් අර්තකථනය කරනු ලැබිය (Sapru, 1976: 20) සංවර්ධනයේ හරය වෙනස කේන්ද්‍ර කොට ගෙන ඇත. නමුත් මෙම වෙනස සමාජය පිළිගනු ලබන විශ්වාස හා සාරධර්ම අනුව ද වෙනස්වේ. වෙ(යි)ඩනර් (widener) විසින් වර්ධනය වීමේ ක්‍රියාවලිය සංවර්ධනය ලෙස හඳුනාගෙන තිබේ (Sapru, 1976: 20). ෆ්‍රෙඩ් ඩබ්. රිග්ස් (Fred, w Riggs) සංවර්ධනය පිළිබඳ ව පුළුල් සාකච්ඡාවක් කරනු ලැබූ චින්තකයෙකි. ඔහු සංවර්ධනය ප්‍රධාන තේමාවන් කීපයක් ඔස්සේ හඳුනාගෙන තිබේ. එනම්,

(අ) රාජ්‍යයේ නිෂ්පාදන යාන්ත්‍රණය ඉහළ දැමීම
(ආ) ප්‍රජාතන්ත්‍රවාදී සාරධර්ම වන නිදහස සමානාත්මතාව හා යුක්තිය ඉහළ නැංවීම
(ඇ) සමාජ ක්‍රමය තුළ සිදුවන වර්ධනය
(ඈ) සමාජ ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම (Sapru, 1976: 20).

සංවර්ධනය ලෙස හඳුනාගත හැක්කේ හුදෙක් ආර්ථික වෘද්ධිය පමණක් නොවන බව මෙම කරුණු අනුව පැහැදිලි වේ. එමගින් සමස්ත සමාජ පද්ධතියේ ම සිදුවන්නා වූ පුළුල් වෙනසක් අපේක්ෂා කෙරේ එනම් පවතින තත්වය හා පැවතිය යුතු තත්වය අතර යම් ආකාර පෙරළියක් සංවර්ධනයේ දී අපේක්ෂා කරනු ලැබේ. මේ නිසයි ඩඩ්ලි සියර්ස් (Dudley Seers) විසින් සමාජ අසමානතාව, දරිද්‍රතාව, විරැකියාව අඩුකිරීමකින් තොර ව සංවර්ධනය පිළිබඳ ව සාකච්ඡා කළ නොහැකි යැයි සඳහන් කළේ (Sapru, 1976: 21). සංවර්ධනය සමාජ ක්‍රමය තුළ ස්ථාපිත වී ඇති සමාජ ව්‍යුහය, ආකල්ප හා ආයතනාත්මක ව සිදුකරනු ලබන වෙනස්කම් මගින් සිදුවන සංකීර්ණ ක්‍රියාවලියකි.

සංවර්ධනය පිළිබඳ සංකල්පය කෙරෙහි මේ ආකාරයට විවිධ දාර්ශනිකයින්ගේ අවධානය යොමු වීමේ ප්‍රතිපලය වූයේ ඒ පිළිබඳ සංකල්පීමය පදනම ප්‍රසාරණය වීම ය, දේශපාලන, ආර්ථික හා සමාජමය වශයෙන් සංවර්ධනය වඩාත් පළල් ආකාරයට විශ්ලේෂණය කිරීම මෙහි ප්‍රතිපලය බවට පත්විය. තුන්වන ලෝකයේ රාජ්‍යයන්ට මෙහි දී හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. සංවර්ධනයේ සංකීර්ණ පසුබිම ජාත්‍යයන්තර ලෝකයාට අවබෝධ කරවන්නේ තුන්වන ලෝකයේ රාජ්‍යයන් විසින් වීම ඊට හේතුව බවට පත් වේ. මේ නිසා සංවර්ධනය මුල් කර ගනිමින් ඉදිරිපත්වූ බොහෝ ප්‍රවේශයන් සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් පසුබිම් කොට ගෙන නිර්මාණය වී තිබේ. සංවර්ධන පරිපාලන සංකල්පය ද ඉදිරියට පැමිනෙන්ණේ මෙබඳු දේශපාලන හා සමාජ පසුබිමක් යටතේ ය.

## අරමුණු

අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්හි සංවර්ධන ප්‍රතිපත්ති කළමනාකරණය කිරීම සඳහා සංවර්ධන පරිපාලන ප්‍රවේශයට හැකිවී ඇත්ද යන්න පරීක්ෂා කිරීම යි. එනම් නව රාජ්‍යයන්හි ආර්ථික ක්‍රියාවලිය කළමනාකරණය කිරීමේ දී සංවර්ධන පරිපාලනය සතු ධාරිතාව පිළිබඳ මූලික සොයා බැලීමක් මෙම පර්යේෂණය මගින් සිදු කරනු ලැබේ.

එමෙන්ම සංවර්ධන පරිපාලනය පිළිබඳ ව ඉදිරිපත්වී ඇති විවිධ ප්‍රවේශ හා අදහස් විමසා බැලීමත් ඒ හරහා සංවර්ධන පරිපාලනය මුල් කරගනිමින් වර්තමානයේ ඉදිරියට පැමිණ ඇති අභියෝග පිළිබඳ ව විචාරාත්මක විග්‍රහයක් සිදුකිරීමටත් මෙම පර්යේෂණය මගින් අපේක්ෂා කරනු ලැබේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු ළඟාකර ගැනීම සඳහා ද්විතීයික දත්ත මූලික වශයෙන් උපයෝගී කරගනු ලැබේ. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මගින් ප්‍රධාන වශයෙන් ම පර්යේෂණයට අදාළ ලිඛිත මූලාශ්‍ර ලබා ගන්නා ලදී. එම ද්විතීයික දත්ත මගින් ලබා ගත් තොරතුරු විශ්ලේෂණය කිරීමේ දී ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගත්තේ සාමාන්‍ය විශ්ලේෂණ ක්‍රමය යි. ඇතැම් අවස්ථාවල දී තුලනාත්මක විශ්ලේෂණ ක්‍රමය ද ඉවහල් කරගනු ලැබී ය.

## සංවර්ධන පරිපාලනය

දෙවන ලෝක යුද්ධයෙන් පසුව තුන්වන ලෝකයේ බොහෝ රාජ්‍යයන්ට විවිධ සමාජ ආර්ථික ගැටළුන්ට මුහුණ දීමට සිදුවිය. දරිද්‍රතාව, සාක්ෂරතාව පහළ මට්ටමක පැවතීම, නොදියුණු සෞඛ්‍යය පහසුකම්, කෘෂිකාර්මික අංශයෙහි පැවති නොදියුණු බව, සමාජ අස්ථාවරත්වය යනාදිය ප්‍රබල අභියෝගයන් බවට පත්වී තිබේ. මෙවන් පසුබිමක් මධ්‍යයේ අලුතින් නිදහස ලැබූ නව රාජ්‍යයන්වලට ප්‍රධාන අභියෝග දෙකකට මුහුණ දීමට සිදුවිය. එනම් ජාතිය ගොඩනැගීමේ හා සමාජ ආර්ථික සංවර්ධනය යි. සමාජ ආර්ථික සංවර්ධනය මුල්කරගෙන නව රාජ්‍යයන් විවිධ උපාය මාර්ග භාවිත කොට තිබේ. එම විවිධ උපාය මාර්ග සහ මෙම රටවල පැවති දේශපාලන සංස්කෘතිය මුල්කරගෙන පොදු එකගතාවන් කීපයකට පැමිණිය හැකි ය.

(අ) රාජ්‍ය හැසිරවීමේ න්‍යාය පත්‍රය තුළ ප්‍රමුඛ ස්ථානයක් හිමි වී ඇත්තේ සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේ පොදු සම්මුතිය වෙතට ය.

(ආ) මෙම රාජ්‍යයන්වල සමාජ ආර්ථික සංවර්ධන සැලසුමෙහි තීරකයා වී ඇත්තේ රාජ්‍යය යි. එනම් මුළුමනින් ම රාජ්‍ය මත පරාධීන වන යන්ත්‍රණයක් වෙත ඉලක්ක හා අරමුණු මෙහෙයවමින්. සිටී.

(ඇ) නව රාජ්‍යයන්හි අරමුණු සාධනය තුළ වඩා ප්‍රමුඛ වී ඇත්තේ ජාතික අරමුණු අභිබවා ගිය ප්‍රාථමික අරමුණු වෙත ය.

(ඈ) දේශපාලන නොසන්සුන්තාව හා අස්ථාවරත්වය මෙම රාජ්‍යයන්හි ව්‍යුහය තුළ විද්‍යමාන ලක්ෂණයන් බවට පත්වී තිබේ.

(ඉ) සාම්ප්‍රදායික දේශපාලන මතාන්තර හා විශ්වාස මැදින් නව දේශපාලන ප්‍රභූ පංතියක් පැන නැගී ඇත.

(ඊ) දේශපාලන ව්‍යුහය හා නිලබල ක්‍රමය සමාජයට දරාගත නොහැකි ලෙස ප්‍රසාරණය වෙමින් පවතී (Basu, 1994: 355).

මෙවන් පසුබිමක් තුළ නව රාජ්‍යන්හි සමාජ ආර්ථික අරමුණු වෙත ශක්තිමත් ලෙස ළඟාවිය හැකි පරිපාලන ව්‍යුහයක් අවශ්‍ය වූ අතර එවන් පරිපාලන ව්‍යුහයක් වැලඳ ගත හැකි නව්‍ය හා ක්‍රියාශීලී සමාජ සංස්කෘතියක් ද අවශ්‍ය විය. සංවර්ධන පරිපාලන විෂය වඩාත් යුහුසුළු ව නව රාජ්‍යයන් විසින් වැලඳ ගන්නේ මෙම සංකීර්ණ අභියෝගවලට විසඳුමක් වශයෙනි. සංවර්ධන පරිපාලන විෂය ප්‍රථම වරට භාවිත කළේ 1955 දී ඉන්දියානු දාර්ශනික වී.එල් ගොස්වාමි (V.L Goswami) විසින් පුවත්පතකට පළකළ ඉන්දියානු සංවර්ධන පරිපාලනයේ ව්‍යුහය (The Structure of development Administration in India) යන ලිපිය මගිනි (Sharma and Sadana, 1996: 123). කෙසේ වෙතත් සංවර්ධන පරිපාලනයේ පියා ලෙස සැලකෙන්නේ ඇමරිකාව මුල්කරගෙන විෂය ජනප්‍රිය කරනු ලැබූ ජෝ(ර්)ජ් එෆ් ග්‍රාන්ට් ය (George F. Grant). සංවර්ධන පරිපාලනය නව රාජ්‍යයන් මත පරායක්තවූ විෂයක් වුව ද විෂයපථය ප්‍රසාරණය කරනු ලැබූයේ බටහිර ඇමරිකානු ගුරු කුලය විසිනි. ඊට ප්‍රධාන හේතුව වූයේ ඇමරිකානු සමාජ විද්‍යාව තුළ තුන්වන ලෝකයේ සංවර්ධන ප්‍රයත්නයන් හා එහි ක්‍රියාවලිය ප්‍රබල මාතෘකාවක් බවට පත්වීම ය. 1960 දශකය තුළ ජනප්‍රිය වූ තුලනාත්මක පරිපාලන කණ්ඩායම (Comparative Public Administration Group- CAG ) විසින් සංවර්ධන පරිපාලනය තුලනාත්මක රාජ්‍ය පරිපාලනයේ උපවිෂය ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගෙන තිබේ. විෂය වඩා පළල් ආකාරයෙන් විශ්ලේෂණය කරනු ලැබුවේ වෙ(යි)ඩ්නර් (Weidner), rs.aia (Riggs), ෆෙරල් හෙඩී (Ferrel Heady), අ(ර්) වින්ග් ස්වෙඩ්ලෝ (Irving Swerdlow) ඇල්ෆ්‍රඩ් ඩයමන්ට් (Alfred Diamant) වැනි දාර්ශනිකයන් විසිනි.

සංවර්ධන පරිපාලනය පිළිබඳ සාකච්ඡාව ප්‍රධාන පරිපාලන ධාරාවන් 2 ක් විසින් පෝෂණය කරනු ලැබ තිබේ. මින් පළමු සාකච්ජාව සිදුකරන්නේ මොන්ට්ගෝමරි (Montgomery) හා ෆේන්සොඩ් (fainsod) විසිනි. සංවර්ධන පරිපාලනය පටු දෘෂ්ටියකින් විග්‍රහ කිරීමට ගනු ලැබූ උත්සාහයක් මෙහි දී දැකගත හැකි ය. මොන්ට්ගෝමරි විසින් ආර්ථික හා ප්‍රාග්ධන යටිතල පහසුකම් දියුණු කිරීම අරමුණු කරගෙන විශේෂයෙන් සෞඛ්‍යය හා අධ්‍යාපන ක්ෂේත්‍ර දියුණු කිරීම මූලික වූ සැලසුම් සම්පාදනමය වැඩ පිළිවෙළක් ලෙස සංවර්ධන පරිපාලනය විග්‍රහ කොට ඇත (Manivasagar, 2001: 272) ෆේන්සොඩ් විසින් සංවර්ධන පරිපාලනය නිර්වචනය කරන්නේ සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් කෘත්‍යාත්මක විශේෂීකරණය හා නවීකරණය අරමුණ කරගනිමින් වැලඳගනු ලැබූ නවීන ක්‍රියාවලියක් වශයෙනි (Basu, 1994: 359) සංවර්ධන පරිපාලනය ආර්ථික සංවර්ධනය ඉලක්ක කොටගත් සමාජ සම්පත් නිසි පරිදි යොදා ගැනීමේ ක්‍රියාවලියක් ලෙසින් හඳුනා ගැනිමට මෙහි දි උත්සාහ දරා තිබේ. එනම් සංවර්ධන පරිපාලනය වැඩ සටහන් මූලික වූ (Programmme Oriented) වෙනස්කම් පිළිබඳ පරිපාලනයක් ලෙසින් මතු වූ සාකාච්ජාවකි. ආර්ථික සංවර්ධනය මත සමපාත වෙමින් කාර්මික සංවර්ධනය හා සම්පත් සජීවිකරණය සංවර්ධන පරිපාලනයේ විෂය මූලධම් බවට හඳුනා ගැනීමට මෙහි දී උත්සාහ දරා තිබේ.

සංවර්ධන පරිපාලනය පිළිබඳ සංවාදය මතුකර දැක්වූ දෙවන ගුරුකුලය නියෝජනය කළේ ලුසියන් පායි (Lucian Pye), ෆෙඩ් ඩබ් රිග්ස් (Fred w. Riggs) හා වෙඩ්නර් (weidner) විසිනි. විෂය වඩාත් පුළුල් ප්‍රවේශයකින් විග්‍රහ කිරීමට මෙහි දී ප්‍රයත්න දරා

ඇත. දේශපාලන, ආර්ථික හා සමාජ සංවර්ධන අරමුණු දිනා ගැනීම සඳහා පරිපාලන ව්‍යුහය තුළ සිදුකරනු ලබන්නා වූ පුළුල් වෙනසක් ලෙසින් සංවර්ධන පරිපාලනය මෙහි දී ඉදිරියට පැමිණ තිබේ. සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්හි ජාතිය ගොඩනැගීම යන ගැටළුව පිළිබඳ ව සංවේදී දෘෂ්ටියකින් මෙහි දී සාකච්ඡාවට ලක්කර ඇත. සමස්ථ සමාජය මූලික වූ අන්තර් සබඳතා ජාලාවක් ලෙසින් සංවර්ධන පරිපාලනය හඳුනාගැනීමට මෙම ගුරුකුලය උත්සාහ ගෙන ඇත. එය ව්‍යුහාත්මක මූලික වූ (Structured oriented) සංකල්පයකටත් වඩා ක්‍රියා මූලික වූ (Action oriented) ප්‍රවේශයකින් නව රාජ්‍යයන් වැලඳ ගැනීමට ගත් කඩිනම් අවශ්‍යතාව මෙහි දී අවධාරණයට ලක් කර ඇත(Basu, 1994: 359) සාම්ප්‍රදායික නිලබල ක්‍රම ආකෘතිය නවීන තත්වයට ගැලපෙන ලෙස වෙනස් කිරීමත් එය කාලීන සමාජ අවශ්‍යතාවන් සමඟ සම්බන්ධ විය හැකි වඩාත් ගතික ප්‍රපංචයක් බවට පත් කිරීමක් මෙහි දී සිදුවිය.

සමාජ ආර්ථික ප්‍රතිසංස්කරණ වඩා ප්‍රබල මුහුණුවරකින් අරමුණු කිරීමට දෙවන ලෝක යුද්ධයෙන් පසුව නව රාජ්‍යයන් පෙළඹීමට පටන් ගෙන තිබේ. සංවර්ධනය පරිපාලනය කිරීමේ අවශ්‍යතාව වඩාත් ප්‍රබල ලෙස දැනෙන කරුණක් බවට පත්වූයේ මේ නිසා ය. එනිසයි සංවර්ධන පරිපාලනයෙහි අරමුණු එහි ආකල්ප හා එහි නීත්‍යනුකූල පාක්ෂිකභාවය වඩාත් වැදගත් බව ජෝර්ජ් කාන්ට් (George cant) සඳහන් කළේ. ජෝර්ජ් කාන්ට් විසින් අවධාරණය කළ සංවර්ධන පරිපාලනයේ අරමුණු තොගයට වෙනස්වීම් කළමනාකරණය, එහි සාර්ථකත්වය හා නවෝත්පාදනය මූලික වශයෙන් සඳහන් වී තිබේ (Hazary, 2006: 11). එහි නීත්‍යානුකූල පාක්ෂිකභාවයේ දී සංවර්ධන පරිපාලනය වඩාත් ප්‍රබල සංකල්පයක් වන අරමුණු පිළිබඳ ව හැඩගැසීම (Goal-oriented), සේවා දායකයා පිළිබඳ ව වූ හැඩගැසීම (Client-centred), වගවීම (Accountability) අවධාරණය කර ඇත. සංවර්ධන පරිපාලනය ආකල්පමය ප්‍රවේශයකින් විග්‍රහ කිරීමේ දී සිදුවී ඇත්තේ එහි පවතින නම්‍යශීලී, උපයෝජනය කළ හැකි සහ ප්‍රතිඵල මූලික වූ ක්‍රියාවලින් අගය කිරීමය (Sharma and Sadana, 1996: 126).

පායි පනන්ඩිකාර් (Pai Panandikar) තම "සංවර්ධනයේ දී පරිපාලනය හැසිරීම" යන අධ්‍යයනය තුළ ආකාර 4 ක චර්යාමය පරිපාලන ලක්ෂණ 4ක් සංවර්ධන පරිපාලනය තුළ දැකගත හැකි බව දක්වා තිබේ.

(අ) වෙනස්වීම් පිළිබඳ හැඩගැසීම (Change orientation)
(ආ) ප්‍රතිඵල මූලික වූ හැඩ ගැසීම (Result orientation)
(ඇ) පුරවැසි සහභාගී මූලික වූ හැඩ ගැසීම (Citizen Participation orientation)
(ඈ) වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කැපවීම (Commitment to work) (Swerdlow, 1963: 13).

සංවර්ධනය හා නවීකරණය අත්පත්කර ගැනීමේ අඛණ්ඩ ප්‍රයත්නයක් බවට සංවර්ධන පරිපාලන විෂය පත් වී ඇති බව පෙනී යයි. එය ඉලක්කවලට යොමු වූ වෙනස්කම් පිළිබඳ සවිඥානිකත්වයක් ඇති පරිපාලනයක් නිර්මාණය කිරීමේ උත්සාහය ඒ තුළ පැවතින. සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්හි සංවර්ධන පරිපාලනය පුළුල් වූයේ

ප්‍රධාන ප්‍රවේශ 2ක් මුල්කරගෙන ය. එනම් දේශපාලන සංවර්ධනය හා ආර්ථික සංවර්ධනය වශයෙනි. නව රාජ්‍යයන්වල ආර්ථික සංවර්ධනය දේශපාලන සංවර්ධනය මත තීරණය වීම මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි. නමුත් දේශපාලන සංවර්ධනය මැනීම සඳහා උපයෝගී කරගනු ලැබූ සාධක බොහොමයක් නව රාජ්‍යයන්හි පැවතියේ නැත. එස්.පී. හන්ටින්ග්ටන්ට (S.P. Huntington) අනුව දේශපාලන සංවර්ධනය ප්‍රධාන කරුණු 4 ක් මත තිරණය කෙරේ.

(අ) තාර්කීකරණය (Rationalization).
(ආ) ජාතික අනුකලනය (National Integration)
(ඇ) ප්‍රජාතන්ත්‍රීයකරණය (Democratization)
(ඈ) සහභාගිත්වය (Participation)

සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යන්හි පැවැති දේශපාලන ක්‍රමය මෙම අවශ්‍යතාවන් සමග සමපාත වූයේ නැත. පරිපාලනමය සංවර්ධනයේ දී මෙම රාජ්‍යයන් සිදුකරනු ලැබුවේ නියමිත වූ (Prescribed) අරමුණු ළඟා කර ගැනීම සඳහා එහි ඵලදායිතාව ඉහළ දැමීමේ ක්‍රියාවලියක් වශයෙනි. නමුත් ඵලදායිතාව තීරණය කරනු ලබන දේශපාලන හා පරිපාලන පරිසරය සංවර්ධනයේ දී ඇගයුමට ලක් නොවී ය.

සංවර්ධන පරිපාලනය තුන්වන ලෝකයේ රාජ්‍යයන්හි භාවිතයට ගත් ආකාරයෙන් පැහැදිලි වූයේ වේගවත් සමාජ ආර්ථික වෙනසක් අපේක්ෂාවෙන් සංවර්ධන සැලසුම්, වැඩසටහන් හා ප්‍රතිපත්ති මුල්කරගත් ක්‍රියාවලියක් වශයෙනි. මා(ර්)ටින් ලැන්ඩන්ට (Marting Landan) අනුව සංවර්ධන පරිපාලනය යනු සමාජය වෙනස් කිරීමේ යන්ත්‍රණයකි (Sapru, 1976: 79). සමාජ යන්ත්‍රණය වෙනස් කිරිමේ දී සංවර්ධන පරිපාලනය මගින් ප්‍රධාන කරුණු 2ක් අවධාරණය කරනු ලැබේ.

(අ) පරිපාලනය දියුණු කිරීම (The administeration of development)
(ඇ) සංවර්ධනය පරිපාලනය කිරීම (The development of administeration)

## සංවර්ධන පරිපාලනයේ අරමුණු හා පරමාර්ථ

සංවර්ධන අරමුණුවල ප්‍රගතිය තීරණය වන්නේ එහි පරිපාලන ශක්‍යතාව මත ය. මේ නිසා සාම්ප්‍රදායික පරිපාලන මූලධර්මවලට නවෝත්පාදන මූලිකාංග හඳුන්වා දෙමින් එය සමාජ ආර්ථික අරමුණු දිනා ගැනීමට ධනාත්මක ව සකසාගත යුතුවේ. මේ නිසා සංවර්ධන පරිපාලනය අරමුණු රාශියකින් සැකසී තිබේ. ජෝර්ජ් කාන්ට්ට (George Cant) අනුව සංවර්ධන පරිපාලනයේ අරමුණු වී ඇත්තේ සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන් උත්තේජනය කිරීම හා ඒවාට පහසුකම් සැලසීම ය. සංවර්ධන පරිපාලනයේ දී හඳුනාගත හැකි අරමුණු කීපයක් පවතී.

සංවර්ධන පරිපාලනයේ ප්‍රධාන අරමුණ බවට පත්වී ඇත්තේ ආර්ථික වෘද්ධිය යි. කාෂිකාර්මික හා කාර්මික සංවර්ධනය ප්‍රසාරණය කරමින් සමාජ ව්‍යුහය සජීවීකරණය කිරීම මෙහි දී සිදු විය යුතුය. යටිතල පහසුකම් ප්‍රසාරණය කිරීමත් එමගින් සමාජය තුළ මූලික අවශ්‍යතාවන් ලබාගත හැකි ආර්ථික සංවර්ධනයක් දියුණු කිරීමත් සිදුකළ යුතු ය. නවීනත්වය මූලික වූ සමාජ වෙනසක් සිදු කිරීම සංවර්ධන පරිපාලනයේ තවත් ප්‍රධාන අරමුණක් ලෙස හඳුනා ගනු ලැබේ. නව්‍ය වෙනසක් නව රාජ්‍යයන්හි පරිපාලන ව්‍යුහය තුළට ඇතුළත් කිරීම නිදහස ලැබීමත් සමඟ ම ප්‍රබල ප්‍රයත්නයක් බවට පත්වී තිබේ. ඊට ප්‍රධාන හේතුව එක් අතකින් සාම්ප්‍රදායික දේශිය සමාජය විසින් බටහිර සාරධම් වැලඳගැනීමට නව රාජ්‍යයන් පෙළඹීම නිසා ය. නවීනත්වය පරිපාලන ක්‍රමය තුළ ඇතිකරන අතර ම සංවර්ධන පරිපාලකයා විසින් සමාජ යුක්තිය ද ඇතිකළ යුතු ය. සමාජ යුක්තිය වූ කලී ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සහභාගිවීම සඳහා සෑම ජනකොටසකට ම ඇති අවකාශයත් එහි ප්‍රතිලාභ සමාන ඉඩ ප්‍රස්තාවන් යටතේ ඔවුන්ට භුක්තිවිඳීමට ඇති අවකාශයේ සාධාරණත්වයත් ය. සමාජය තුළ සංවර්ධන ප්‍රයත්නයන් මගින් අවකාශ නොලැබෙන කාන්තාවන්, පහත් කුලහීන ජන කොටස් වෙත මෙහි දී සංවර්ධන ප්‍රතිලාභ මගින් පුළුල් නැමියාවක් සිදුකළ යුතුවේ. මෙහි දී ආකල්පමය වෙනසක් සිදුකිරීම සංවර්ධන පරිපාලනයේ තවත් ප්‍රධාන අරමුණක් ලෙසින් හඳුනා ගැනීමට සිදුවේ. ආකල්පමය වෙනසක් සිදුකළ යුත්තේ සංවර්ධන පරිපාලනයේ නවමු වූ මූලෝපායන් වැලඳ ගැනීමට සමත් සිවිල් සමාජයක් අත්‍යවශ්‍ය වන නිසා ය. සාම්ප්‍රදායික ආකල්ප මත පදනම් වෙමින් පරිපාලනය මුල්කරගත් කළමනාකරණ වෙනසක් සිදුකළ නොහැකි ය. ආකල්පමය වෙනසකින් අපේක්ෂිත පරමාර්ථ සපුරාලීම සංවර්ධන පරිපාලනයේ තවත් අරමුණක් වෙත රාජ්‍ය යන්ත්‍රණය පහසු කරවයි. එනම් ජාතිය ගොඩ නැගීම හරහා රාජ්‍යයට ශක්තිමත් පදනමක් ඇතිකිරීම මෙහි දී වැදගත්කොට සැලකිය යුතු ය. ජාතිය ගොඩනැගීම නව රාජ්‍යයන්හි ප්‍රධාන ම සමාජ අභියෝගයක් බවට පත්විය. මේ නිසා සංවර්ධන පරිපාලනයේ හරය බවට ඇතැම් පරිපාලන විද්වතුන් විග්‍රහ කරනු ලැබූයේ ජාතිය ගොඩ නැගීම යි. ජාතිය ගොඩ නැගීමේ සමාජ අභියෝගය සමග සංවර්ධන පරිපාලනයේ දිශානතිය තීරණය කරන ප්‍රධාන ප්‍රවාහයක් ලෙසින් දේශපාලන සංවර්ධනය හඳුන්වාදිය හැකි ය. දේශපාලන සංවර්ධනය ලුසියන් ඩබ් පායි (Lycian w. pye) තම සංවර්ධන පරිපාලනයේ දිශානතින් (Aspects of development administeration) යන කෘතියේ දී සඳහන් කරන්නේ ප්‍රධාන කරුණු තුනක එකතුවකින් ගොඩනැගෙන බව ය.

(අ) සමානාත්මතාව (Equality)
(ආ) ධාරිතාව (Capacity)
(ඇ) විවිධාංගිකරණය (Differentiation) (Das and Choudhury, 1997: 117).

දේශපාලන සංවර්ධනයේ දී නීතිය ඉදිරියේ සමානාත්මතාව, පවතින දේශපාලන ක්‍රමයේ ධාරිතාව, ජනතා අවශ්‍යතාවන් සමග සමපාත වීමේ ප්‍රමාණය, රාජ්‍යයේ කාර්‍යයන් විවිධාංගීකරණය කොට තිබීම, ජාතිය නිර්මාණය කිරීමේ අභියෝගයට ගැලපෙන පරිදි සිවිල් සමාජය සකස් කොට තිබීම වැනි අවශ්‍යතාවන් සම්පූර්ණ වී පැවතීම අත්‍යවශ්‍ය වේ. මෙම සියලු ම අරමුණුවල ප්‍රධාන පරමාර්ථය වන්නේ තිරසාර

සංවර්ධනය යි (sustainable development). සංවර්ධන පරිපාලනයේ අරමුණු විය යුත්තේ අපේක්ෂිත ආර්ථික වෘද්ධිය පවතින සමාජ අවශ්‍යතා සමග මනා ව කළමනාකරණය කර ගැනීම ය. සම්පත් පරිභෝජනයේ දී අනාගත අපේක්ෂාවන්ට හානි නොවන පරිදි වර්තමානයේ අවශ්‍යතාවන් සපුරාගත යුතු ය. සංවර්ධන අරමුණු පාරිසරික පැවත්ම සමඟ අනුයෝජනශීලි විය යුතු ය.

සංවර්ධන පරිපාලනය ආර්ථික අරමුණු මත කළමනාකරණය කිරීමට දරනු ලැබූ උත්සාහයෙහි ප්‍රතිඵලයන් වූයේ ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීමේ උපක්‍රම කෙරෙහි නව රාජ්‍යයන්හි අවධානය යොමුවීම ය. ඒ අනුව සංවර්ධන පරිපාලනය ආර්ථික සංවර්ධන ඉලක්ක මූලික වූ හැඩගැසීමක් දැකිය හැකි ය. එනිසා ම පැවති සාම්ප්‍රදායික ආර්ථික සමාජ පසුබිමට විකල්ප ව එය නව වෙනසක් අපේක්ෂා කරනු ලැබූ පරිපාලන ක්‍රමවේදයකි. නව වෙනසක් අපේක්ෂාවෙන් ක්‍රියාත්මක කරනු ලැබූ විවිධ සංවර්ධන ප්‍රවේශයන්ගෙන් ප්‍රතිඵල මූලික වූ හැඩගැසීමක් ද (result orientation) අවධාරණය කරනු ලැබූ බව පෙනී යයි. නිශ්චිත වූ අරමුණු ළඟාකර ගැනීම සඳහා ඉලක්ක ගත කාල රාමුවක් ද (time orientation) පැවතිය යුතුය. සංවර්ධන වැඩසටහන් කළමනාකරණයේ දී එහි ප්‍රතිඵල නිවැරදි ව ළඟාකර ගැනීමට නම් එහි දී සේවා දායකයා (client – orientation) මුල් විය යුතු ය. සේවාදායකයා හා අදාළ ඉලක්ක නිවැරදි ප්‍රතිඵල බවට පත්කර ගත හැක්කේ එම එක් එක් ආයතන අතර මනා සහයෝගීතාවක් (commitment) පවතින්නේ නම් පමණි. එම සහයෝගීතාව මුල්වී පරිපාලන ක්‍රමයේ නව්‍යත්වයට අදාළ වන්නා වූ නවෝත්පාදනශීලි (innovation) යොමුවක් ද සංවර්ධන පරිපාලනයේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයකි (Sharma and Sadana 1996: 124-126).

සංවර්ධන වැඩසටහන්වල ප්‍රායෝගික වැදගත්කම තීරණය වන්නේ ජනතා සහභාගිත්වයේ (people's participation) ප්‍රමාණය මත ය. ජනතා සහභාගිත්වය සහ සංවර්ධනය එකිනෙක හා සමීප සාකච්ඡාවන් වන අතර සංවර්ධන පරිපාලනයේ දී ජනතා සහභාගිත්වය තිරණය කරන පරිදි පරිපාලන ක්‍රමය සැකසීමේ අවශ්‍යතාව ද සාකච්ජාවට ලක්වී තිබේ. විමධ්‍යගතකරණය (decentralization) සංවර්ධන මූලෝපායන්වල ප්‍රධාන විෂය ක්ෂේත්‍රයක් වී ඇත්තේ මෙම හේතුව නිසා ය.

සංවර්ධන පරිපාලනය 1950-1960 දශකයේ දී තුන්වන ලෝකයේ රාජ්‍යයන්වල වැලඳ ගැනීම සිදුවී ඇත්තේ පරිපාලනය හා සංවර්ධනය අතර නවෝත්පාදනශිලී යොමුවක් ඇති කිරීමේ අරමුණෙනි. රොන්ඩිනෙල්ලීට (Rondinelli) අනුව සංවර්ධන පරිපාලනය නව රාජ්‍යයන්හි ජනප්‍රිය විෂයක් විම පිළිබඳ ව ප්‍රධාන තේමාවන් දෙකක් පැවැතිනි. ප්‍රථමයෙන් ම සංවර්ධන පරිපාලනය නව රාජ්‍යයන්හි ස්ථාපිත වීමේ ක්‍රියාවලියේ දී සිදුවී ඇත්තේ මෙම රාජ්‍යයන් ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ක්‍රියාත්මකවීමේ දී කාර්මික රාජ්‍යයන් අනුගමනය කිරීමට පෙළඹීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස වෙබේරියානු නිලබලක්‍රම ආකෘතියට යොමුවෙමින් අනම්‍යශීලි නිලබලක්‍රමයකට මෙම රාජ්‍යයන් පෙළඹී ඇත. පරිපාලන ක්‍රමය තාර්කික හා දේශපාලනමය වශයෙන්

මධ්‍යස්ථ බවට පත්කිරීමට මෙහි දී නව රාජ්‍යයන් යොමුවූ බව පෙනී යයි. සංවර්ධන පරිපාලනය නව රාජ්‍යයන්හි ස්ථාපිත වීම සිදුවී ඇත්තේ අනපේක්ෂිත අවස්ථාවක බව අනෙක් ප්‍රවාදයෙන් ප්‍රකාශ වේ. ඒ අනුව සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් ආර්ථික හා සමාජ සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට පෙර දේශපාලන ක්‍රියාවලිය හා පරිපාලන ව්‍යුහය නවීකරණය කර ගත යුතුවේ. පරිපාලන හා දේශපාලන ක්‍රමය සාම්ප්‍රදායික දෘෂ්ටිකෝණවල එල්බගෙන පැවතීමත් නවෝත්පාදනයකට අවශ්‍ය දේශපාලන ශාක්‍යතාව නොපැවතීමත් අනාගත අභියෝග ලෙසින් මෙහි දී සඳහන් වී ඇත (Basu, 1994: 357).

සංවර්ධන පරිපාලනය නව රාජ්‍යයන්හි ඉදිරියට පැමිණියේ රාජ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශයකිනි. සාම්ප්‍රදායික මතවාදී කණ්ඩායමේ අදහසට අනුව සංවර්ධන පරිපාලනයේ ගාමක බලවේගය වී ඇත්තේ රාජ්‍යය යි. රාජ්‍ය සමාජ ආර්ථික ප්‍රතිසංස්කරණවල වැඩි කාර්යභාරයක් ඉටුකිරීමේ දී නව රාජ්‍යයන් මුහුණදුන් ප්‍රධාන අභියෝගය වූයේ රාජ්‍යයේ කළමනාකරණ හැකියාව කෙසේ වර්ධනය කරන්නේ ද යන්න යි. සාම්ප්‍රදායික පරිපාලන මතවාදය බැහැර කරන තාර්කික මතවාදීන් ප්‍රකාශ කරන්නේ සංවර්ධන පරිපාලනයේ දී පරායකත්තා න්‍යාය ප්‍රබල බලපෑමක් තුන්වන ලෝකයේ රාජ්‍යයන්ට සිදුකොට ඇති බව යි. සංවර්ධිත යැයි හඳුනාගනු ලැබූ බොහෝ සංවර්ධන ආකෘති බටහිර ගුරුකොට ගනිමින් නව රාජ්‍යයන්හි පරිපාලන ක්‍රමයට එකතුකර ගැනීමට මෙහි දී උත්සාහ කරනු ලැබූ බව පෙනී යයි. එම පරිපාලන උපක්‍රම මගින් නව රාජ්‍යයන්හි දේශපාලන හා පරිපාලන ක්‍රමය තුළ නව වෙනසක් ඇතිකළා සේම සාම්ප්‍රදායික සංස්කෘතිය මත අනාගත අභියෝග රාශියක් ද නිර්මාණය කරනු ලැබී ය.

## සංවර්ධන පරිපාලනයේ විවිධ ප්‍රවේශ

සංවර්ධන පරිපාලනය විෂයක් ලෙස තුන්වන ලෝකයේ රාජ්‍යයන්හි ස්ථාපිත වීම සිදුවන්නේ එකම ස්වරූපයකින් නොවේ. සංවර්ධන පරිපාලනය පෝෂණය කරනු ලැබූ මතවාදවල පැවති විවිධත්වය ඊට හේතු වූ බව පෙනී යයි. එක් ප්‍රවේශයකින් ප්‍රකාශ වූයේ ඉහළ මට්ටමේ පරිපාලන මූලධර්ම භාවිත කරමින් සංවර්ධන වැඩ සටහන් මූලික කරගත් සුවිශේෂී සැලැස්මක් නිර්මාණය කරගත යුතු බව යි. මෙම ප්‍රවේශය සැලසුම් කෙටුම්පත් ප්‍රවේශය (blueprint approach) ලෙස හඳුනා ගත හැකි ය. ප්‍රජාව සහභාගිකර ගන්නවාට වඩා ප්‍රජාව ඉලක්ක කරගත් උසස් ආකාරයේ සැලසුම් සම්පාදනයක් මගින් නව රාජ්‍යයන්හි සංවර්ධන අපේක්ෂා ළඟාකර ගැනීමට මෙහි දී උත්සාහ ගෙන තිබේ (Basu, 1994: 368-369). වඩා නිලබලකාරී ප්‍රවේශයකින් ඉදිරිපත් විය යුතු සංවර්ධන ක්‍රමෝපායන් පිළිබඳ න්‍යායක් ලෙස සැලසුම් කෙටුම්පත් ප්‍රවේශය සැලකිය හැක.

සංවර්ධන පරිපාලනය පිළිබඳ සාකච්ඡාව ඉදිරියට ගෙනගිය තවත් න්‍යායකින් ප්‍රකාශ වූයේ සැලසුම් සම්පාදනයේ දී සිදුවිය යුත්තේ මිනිසුන් උදෙසා උසස් සැලසුම් නිර්මාණය කිරීම නොව මිනිසුන් විසින් ඔවුන් සම්බන්ධ කොටගෙන සැලැසුම්

සම්පාදනය කළ යුතු බව යි. මෙම න්‍යාය ඉගනීමේ ක්‍රියාවලිය මූලික වූ ප්‍රවේශය (learning – process approach) ලෙස සැලකේ. සංවර්ධන වැඩසටහන් පරිපාලනය කිරීමේ දී ප්‍රජාව සමග මිශ්‍රවෙමින් ඔවුන් හා සමග සම්බන්ධ වූ ප්‍රතිපත්තියක් වෙත ගමන් කළ යුතුබව මෙම මත වාදයෙන් පැහැදිලි කරනු ලැබී ය (Basu ,1994: 369).

සංවර්ධන පරිපාලනය ස්ථාපිත වූ බොහෝ නව රාජ්‍යයන්වල එය ප්‍රජා මූලික පදනමින් විග්‍රහ කිරීමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි. නමුත් විෂය ස්ථාපිත වූ මුල් කාලය තුළ එය ප්‍රජා මූලික වනවාට වඩා නිෂ්පාදන මූලික වූ ප්‍රවේශයකින් (production oriented approach) විග්‍රහ කිරීමට උත්සාහ ගනු ලැබීය. ඊට ප්‍රධාන හේතුව වූයේ ආර්ථික සංවර්ධනය සංවර්ධන පරිපාලනයේ අග්‍රතම ඵලය ලෙස හඳුනාගැනිමට මෙම රාජ්‍යයන් පෙළඹී ඇති බැවිනි. නිෂ්පාදන ඵලදායිතාව හා භාණ්ඩ ඉහළ දැමීම හරහා සංවර්ධන අරමුණු සඵල කරගත හැකි ය යන විශ්වාසය මෙහි දී ඉලක්ක ගත අරමුණ වී ඇත. නමුත් මෙම මතවාදය මගින් තිරසාර සංවර්ධන අරමුණු සඵල කර ගැනීමේ ව්‍යායාමය අමතක කොට තිබේ. නිෂ්පාදන මූලික වූ න්‍යාය මගින් අපේක්ෂිත අරමුණු කිපයක් පැවතුනි.

(අ) කෘෂිකාර්මික දියුණුවට වඩා කාර්මික දියුණුව ළඟාකර ගැනීම.
(ආ) ග්‍රාමීය සංවර්ධනය වෙනුවට නාගරික සංවර්ධනය අපේක්‍ෂා කිරීම.
(ඇ) මානව සම්පතට වඩා ප්‍රාග්ධන මූලික වූ සම්පත් කෙරෙහි දැඩිලෙස රඳා පැවතීම.
(ඈ) කෙටිකාලීන ශීඝ්‍ර ආර්ථික සංවර්ධනය ඉලක්ක කිරීම ඒ හරහා භෞතික පරිසරයට දැඩි බලපෑමක් සිදු වී තිබේ.
(ඉ) සුළු පරිමාණ තාක්‍ෂණික ක්‍රම වෙනුවට මහා පරිමාණ තාක්‍ෂණික ක්‍රම භාවිත කිරිම (Basu, 1994:369).

නිෂ්පාදන මූලික වූ න්‍යාය එක් අතෙකින් තුන්වන ලෝකයේ රාජ්‍යයන්හි දුප්පත් ග්‍රාමීය කොටස්වල අවශ්‍යතාවන් නොසලකා හැරියා සේම සමාජ ආර්ථික අසමානතාව ද ඉහළ දමා තිබේ. පරිසරය සංවර්ධනයේ අවශ්‍යතා අනුව අසීමිත ලෙස සූරාකෑමේ ප්‍රයත්නයක් මෙම මතවාදය මගින් ප්‍රකාශිත යි.

නිෂ්පාදනමූලික වූ න්‍යායට ප්‍රතිවිරුද්ධ ව යමින් වර්තමානය වනවිට ප්‍රජා මූලික වූ සංවර්ධන පරිපාලන ප්‍රවේශයකට (people- centred approach) බොහෝ සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් පැමිණ තිබේ (Basu, 1994: 369). සංවර්ධන සැලසුම් සම්පාදනයේ දී ප්‍රජාව සහභාගි කරවා ගනිමින් ඔවුන්ගේ අවශ්‍යතාවලට සැබෑ විසඳුම් ලබාදීමට මෙහි දී අවධානය යොමුකොට ඇත. මෙම න්‍යායේ පදනම රැඳී ඇත්තේ ප්‍රජාව සවිබල ගැන්විමය (empowerment of people) එනම් ප්‍රජාවගේ අවශ්‍යතාවන්ට මුල්තැන ලැබෙනසේ පරිපාලන ක්‍රියාවලිය සංවර්ධන කිරිම මත ය. ප්‍රජාව මූලික වූ සංවර්ධන ප්‍රවේශය මගින් අපේක්‍ෂිත අරමුණු කිපයක් වේ.

(අ) මානව සංවර්ධනය හා සහජීවනය
(ආ) සමානාත්මතාව
(ඇ) ස්ව විශ්වාසය කෙරෙහි රඳා පැවැත්ම
(ඈ) සහභාගිත්වය
(ඉ) තිරසාර සංවර්ධනය (Basu, 1994: 369).

මෙම ප්‍රවේශය පරිසර හිතකාමී දෘෂ්ටියකින් ඉදිරියට පැමිණ ඇති අතර එමගින් අනාගත අපේක්ෂාවන්ට හානි නොවන පරිදි වර්තමානයේ සම්පත් පරිභෝජනය පිළිබඳ ව සමාජය හුරුකොට තිබේ.

සංවර්ධන පරිපාලනය පිළිබඳ ව ඉදිරිපත් වූ වඩාත් පුළුල් න්‍යායක් වූයේ ෆ්‍රෙඩ් ඩබ්. රිග්ස් (Fred w. Riggs) විසින් ඉදිරිපත් කළ මතවාදය යි. රිග්ස් උත්සාහ කරනු ලැබුයේ පරිපාලන ක්‍රමය ඒ හා සම්බන්ධවන්නා වූ පරිසරය අතර තුලනාත්මක විග්‍රහයක යෙදීමට ය. පරිපාලන ක්‍රමය හුදකලාව ගෙන විග්‍රහ කිරීම ප්‍රායෝගික නොවනවා ය යන අදහස රිග්ස් සනාථ කරනු ලැබුයේ පරිපාලන ක්‍රමය ඒ හා සබැඳි ව පවත්නා සමාජ ආර්ථික දේශපාලන ක්‍රමය සමග සම්බන්ධ කොට අධ්‍යයනය කිරීමෙනි. පරිපාලන ක්‍රමය බාහිර පරිසර සාධකවලින් වෙන් කොට හුදකලා කිරීම අපහසු ය. මෙම න්‍යාය පසුබිම් ප්‍රවේශය (ecological approach) ලෙස හැඳින්වෙන්නේ ද මේ නිසාය. රිග්ස් තම න්‍යාය පුළුල් කරනු ලැබුයේ ව්‍යුහකෘත්‍යවාදී ප්‍රවේශය (structural functional approach ) හා පසුබිම් ප්‍රවේශය භාවිතයට ගැනීමෙනි. ව්‍යුහකෘත්‍යවාදී ප්‍රවේශයෙ දී සමස්ත ක්‍රමය ම එකම පද්ධතියක් වශයෙන් සලකා විශ්ලේෂණය කරන අතර එහි දී එකිනෙක පද්ධතිය හා ඉන් ඉටුවන්නාවූ කාර්‍යයන් මුල්කරගෙන තුලනාත්මක විග්‍රහයක් සිදුකරනු ලැබේ. රිග්ස් ප්‍රිස්මැටික් ආදර්ශය (prismatic model) ඉදිරිපත්කළේ පසුබිම් ප්‍රවේශය හා ව්‍යුහකෘත්‍යවාදී ප්‍රවේශය ආදර්ශයට ගනිමිනි. ඔහු ප්‍රධාන සමාජ ක්‍රම 3ක් මෙහි දී හඳුනාගනී. විලන (fused) සමාජය තුළ තනි ව්‍යුහයක් විවිධ කෘත්‍යයන් ඉටුකරන අතර වර්තන (diffraction) සමාජයේ දී නිශ්චිත කෘත්‍යයන් ක්‍රියාවට නැංවීමට වෙන් වෙන්වූ ව්‍යුහයන් නිර්මාණය වී තිබේ. විලන හා වර්තන සමාජවල පවතින ලක්ෂණ එකලග පවතින්නාවූ සමාජ ඔහු ප්‍රිස්මැටික් (prismatic) සමාජය ලෙස හඳුනාගෙන ඇත (Basu, 1994: 370)' සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්හි පරිපාලන ක්‍රමය සංවර්ධනය කිරීමේදී සිදුවූයේ එක් අතකින් සාම්ප්‍රදායික නිලබලධාරී පරිපාලන ක්‍රමයට බාහිර ආටෝපයන් ලෙසින් දියුණුයයි සම්මත පරිපාලන උපක්‍රම ආදේශනය කිරීමයි ප්‍රිස්මැටික් සමාජය ලෙසින් රිග්ස් හඳුනාගත්තේ සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්වල මෙම අසමතුලිත වූ පරිපාලන ආකෘතිය යි. රිග්ස් සංවර්ධන පරිපාලනය අරමුණු මූලික වූ (goal oriented) පරිපාලන ක්‍රියාවලියක් ලෙසින් හඳුනාගැනීමට උත්සාහකර ඇත. මෙහි දී නියමිත අරමුණු (prescribed-goals) දිනා ගැනීම සඳහා පරිපාලන ක්‍රමය සංවර්ධනය කළයුතු බව රිග්ස්ගේ අදහස විය.

## නිගමන හා යෝජනා

සංවර්ධන පරිපාලනයේ දිශානතිය හා අපේක්ෂාවන් වර්තමානය වනවිට සංකීර්ණ පසුබිමක් වෙත ගමන් කරමින් තිබේ. ඒ තුළ වඩා ප්‍රමුඛ වූ මූලිකාංග බවට වර්තමානය වනවිට විශේෂයෙන් නව රාජ්‍යයන්හි ආර්ථික හා සමාජ සංවර්ධනයත් ඒ හරහා නිර්මාණය වී ඇති පරිසරය පිළිබඳ අභියෝගයන් ප්‍රමුඛ වී ඇත. මෙම පසුබිම තුළ සංවර්ධන පරිපාලනයේ වර්තමාන හා අනාගත හර පද්ධතීන් තීරණය වීමේ දී එළඹිය හැකි නිගමන කීහිපයක් තිබේ.

(අ) සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන්වල ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සම්පාදනය, සංවිධාන කටයුතු මෙහෙයවීම යනාදීයේ දී තීරකය වී ඇත්තේ රාජ්‍යය යි. රාජ්‍යයේ කාර්යභාර්ය වැඩිවත්ම ඒවා සංවර්ධන අරමුණු වෙත සමපාත කිරීමේ වගකීම ද ප්‍රධාන අභියෝගයක් ලෙසින් රාජ්‍යයට මුහුණ දීමට සිදුවී ඇත.

(ආ) ක්‍රම ක්‍රමයෙන් සංකීර්ණ හා කාර්මික ක්ෂේත්‍රය වෙත වැඩිනැඹුරුතාවක් දක්වමින් නව රාජ්‍යයන්හි පරිපාලන කෘත්‍යයන් ක්‍රියාත්මක වෙමින් පවතී.

(ඇ) සැලසුම් සම්පාදනය, සම්බන්ධීකරණය හා පාලනය යන සියලු ම රාජ්‍ය කෘත්‍යයන් සංවර්ධන අරමුණු සමඟ එකිනෙකට සම්බන්ධ වෙමින් තිබේ.

(ඈ) නව රාජ්‍යයන්හි රාජ්‍ය කළමනාකරණයේ දී පරිපාලන ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරීම් විශාල අභියෝගයන් බවට පත්වෙමින් පවතී.

(ඉ) සේවක මණ්ඩල කළමනාකරණය, පුහුණුව වඩාත් ප්‍රබල සාකච්ඡාවන් බවට පත්වී තිබේ. නමුත් නව රාජ්‍යයන්හි නිර්මාණය වී ඇති දැඩි නිලබලක්‍රම සංස්කෘතිය ඊට දැඩි බලපෑම් කරමින් සිටී.

(ඊ) සංවිධානමය තීරනනිර්මාණය නම්‍යශිලි හා නවෝත්පාදනශිලී විය යුතු ය. සේවා පෙළඹවීම් මූලික වූ සංවිධාන ව්‍යුහයක් වෙත ගමන් කල යුතු ය.

(උ) සාමූහික ව ගැටළු ජයගැනීම හා සාමූහික තීරණ නිර්මාණයක් වෙනුවෙන් නව රාජ්‍යයන්හි ව්‍යුහය ප්‍රතිසංස්කරණය කළ යුතු ය.

(ඌ) විමධ්‍යගතකරණ වැඩසටහන්වල ඉහළ යාම නිසා ප්‍රාදේශික ස්වාධීන ඒකක වඩාත් බලවත් වෙමින් සංවර්ධන ඒකක ස්වාධීන වී ඇත.

(එ) සංවිධාන ධුරාවලිය තුළ නිදහස් සන්නිවේදන ගලායාමක් සියලු ම ආයතනවල පැවතිය යුතු ය.

(ඒ) පරිපාලන ක්‍රමය හා දේශපාලනය අතර යහ සබඳතාවන් පැවතිය යුතු ය.

(ඔ) සංවර්ධන වැඩසටහන් කළමනාකරණයේ දී සක්‍රිය ප්‍රජා සහභාගිත්වයක් හා දායකත්වයක් පැවතිය යුතු ය.

සංවර්ධන පරිපාලනය ඉදිරියේ ඇති අභියෝගයන් සහ නව රාජ්‍යයන්හි අනාගත සංවර්ධන අභියෝග මෙහි දී පුළුල් ලෙස සාකාච්ඡා වී තිබේ. ආර්ථික සංවර්ධනය කළමනාකරණයේ දී සමස්ත රාජ්‍යය ව්‍යුහය ම නවීකරණයට ලක්කිරීමේ අවශ්‍යතාව වර්තමානය වනවිට මතුවී තිබේ. එක් අතෙකින් සංවර්ධන අභියෝගයනුත් අනෙක් අතින් එම සංවර්ධන අභියෝග කළමනාකරණයේ දී පරිසරය පිළිබඳ සාධකයත් වර්තමානයේ වඩාත් පුළුල් සාකච්ඡාවන් බවට සංවර්ධන පරිපාලන තුළ ඉදිරියට පැමිණ තිබේ.

## පරිශීලිත මූලාශ්‍රයෝ


Basu, R. (1994) Public Administration: Concepts and Theories, Sterling Publishers Private limited.

Coetzee, J. K. and Wood, G. (2001) Development: Theory, Policy and Practice, Oxford University Press.

Corbridge, S. (2000) Development: Critical Concepts in the social Sciences, Routledg.

Cowen, M. and Shenton, R.W. (1996) Doctrines of Development, Routledg.

Das, H.H. and Choudhury B.C. (1997) Introduction to Political Sociology, Vikas Publishing.

Hazary, N. (2006) Development Administration, APH Publishing Cooperation.

Manivasagar, A.V. (2001) Aspect of Public Administration, Almora, South Asian Social Sciences Trust kumaon Hills.

Sapru, R.K. (1976) Development Administration, Deep and Deep Publications.

Sharma, M.P. and Sadana B. L. (1996) Public Administration in Theory and Practice, New Delhi, Kitab Mahal.

Swerdlow, I. (1963) Developmet Administration Concepts and Problems, USA, The Heffernan Press Inc.

Todaro, M. and Smith S.C. (2003) Economic Development, Pearson Education, Ltd.

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

පස්වැනි කලාපය 2009 ජනවාරි

ද්විතීය භාගය

ශ්‍රී ලංකාවේ ආරක්‍ෂක ප්‍රතිපත්තිය තුළ ඉන්දියානු සාධකය සංකල්පගත වීම සහ එහි ක්‍රියාකාරීත්වය (1948-1977)
ආර්.ඩී. ජයනෙත්ති 191-206

දෘශ්‍යාත්මක මානව විද්‍යාව හා මානවවංශලේඛ චිත්‍රපට
සුමින්ද කේ. ගුණරත්න 207-224

ශ්‍රී ලංකාවේ දෙවන තරුණ නැගී සිටීම (1988-1989) හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්
කේ.එම්. චාමින්ද බණ්ඩාර 225-246

පාරිභෝගික ධනවාදයේ දැවැන්තකරණය තුළ ඇල්බෙයා කැමුගේ 'පිටස්තරයා' නවකතාව 'නිර්බුර්ෂුවාකරණ1 ශූන්‍යතාලේඛනයක්' වශයෙන් අන්තර්ගත ප්‍රතිරෝධතා ශක්‍යතාව මැන බැලීම
මහේෂ් හපුගොඩ 247-280

සාහිත්‍ය විචාරය හා අනිත්‍ය/විසංයෝජනයට න්‍යායාත්මක ප්‍රවේශයක්
මහින්ද පතිරණ 281-291

ශිලාලේඛනාගත මූලික වාක්‍යාකෘතික ස්වරූප පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ක්‍රි. පූ. 03 ක්‍රි. ව. 7 අවසන තෙක් සෙල්ලිපි ඇසුරිනි)
මිනුවන්ගමුවේ මහානාම හිමි 293-309

ශ්‍රී ලංකාවේ උපාධි අපේක්ෂකයින්ගේ කියවීමේ රුචිකත්වය සහ පුස්තකාලයීය භාවිතය
අයි.එම්. නවරත්න 311-325

සංවර්ධනය වන රටවල දරිද්‍රතාව කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්
එම්.ඩී.ජේ.ඩබ්. විජේසිංහ 327-347

සංවර්ධන පරිපාලනය පිළිබඳ හැඳින්වීමක්
ජී.සී.එල්. පතිරණ 349-362

ISSN: 1800 - 1459

## National Digitization Project

### *National Science Foundation*

Institute : Sabaragamuwa University of Sri Lanka

1. Place of Scanning : Sabaragamuwa University of Sri Lanka, Belihuloya
2. Date Scanned : ..2017.-10.-02.........................................................
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : ...S. A. C. Sadaruwan.....................................

Signature : .................................................................................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : LIBRARIAN..........................................................................

Name : T.N. NEIGHSOOREI..................................................................

Signature : ..........................................................................................

Date : ..2017.-10.-02.........

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*